මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவிசெயலாளர<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/12/IT2 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026.02. 24. |

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
මධ්‍යම පළාත් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන්.

**<u>තොරතුරු තාක්ෂණ (ICT) දැනුම සහිත නිලධාරීන් දෙදෙනෙකු මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අනුයුක්ත කර ගැනීම</u>**

නව රජයේ ප්‍රමුඛ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස ක්‍රියාත්මක වන ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුල රාජ්‍ය සේවය කාර්යක්ෂම හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සියලු ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කරමින් හැකිතාක් මානව දුර්වලතා, සංකීර්ණ පියවරයන් අනුගමනය කිරීම හා තැපැල් ලිපි ගණුදෙනු වල ඇති ප්‍රමාදයන් අවම කරමින් කඩදාසි භාවිතය අවම රාජ්‍ය සංවිධානයක් ලෙස 2026 වර්ෂයේ මැද භාගයේ සිට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ හා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මඟපෙන්වීම යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

02. මෙම ව්‍යාපෘතියේ මූලික පද්ධති නිර්මාණ කටයුතු (Programming),පද්ධති නඩත්තුව(System Maintenance), තාක්ෂණික ගැටළු නිරාකරණය ඇතුළුව තොරතුරු තාක්ෂණය හා සබැඳි අනෙකුත් කටයුතු ඉටු කරවා ගැනීම උදෙසා, මේ වන විටත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරීන් දෙදෙනෙකු දැනට සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානීන්ගේ එකඟතාවය සහිතව,ආයතන අතර නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධව පවතින විධිවිධාන අනුගමනය කරමින් අනුයුක්ත කර ගැනීමට හැකියාව පවතින බව ප්‍රධාන ලේකම්ගේ අංක CPC/CS/1/IT2/1 හා 2026.01.31 දිනැති ලිපිය මඟින් මා වෙත දැනුම් දී ඇත.

03 ඒ අනුව,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උපාධි/ඩිප්ලෝමා/ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ-Level 05) සහිත Computer Programming/Language පිළිබඳව අත්දැකීම් හා/හෝ තොරතුරු තාක්ෂණය විෂයය පිළිබඳ සුවිශේෂී හැකියාවක් සහිත, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන තනතුරු දරන, මේ වන විටත් මධ්‍යම පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තුවල සේවය කරනු ලබන නිලධාරීන්ගෙන් මේ සඳහා අයදුම්පත් කැඳවීමට තීරණය කර ඇත.

04. ඒ අනුව, මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ඔබේ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ සේවය කරන අදාළ සුදුසුකම් සහිත සියලුම නිලධාරීන් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, අමුණා ඇති ආදර්ශ අයදුම්පත සම්පූර්ණ කර, ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව **2026 මාර්තු මස 15 දිනට ප්‍රථම "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර"** යන ලිපිනය වෙත ලැබීමට සැලැස්වීමට දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. මූලික සුදුසුකම් සපුරාලන නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, තෝරාගනු ලබන නිලධාරීන් තිදෙනෙකු සේවා අවශ්‍යතාව මත තාවකාලික අනුයුක්ත පදනම මත සේවයේ යොදවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. මෙම කරුණු පිළිබඳව ඔබ අමාත්‍යාංශය/ආයතනය යටතේ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්/කළමනාකරණ සේවා නිලධාරීන් ඇතුළු වෙනත් පෙර කී සුදුසුකම් සහිත,මේ පිළිබඳ උනන්දුවක් දක්වන නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

07. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහාය ඉතා අගය කොට සලකමි.

.................................................

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.
ජංගම දුරකථන අංකය :- 070-7471119

විෂයය සම්බන්ධීකරණ නිලධාරි: උපේක්ෂා - 070-2773639